# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1933/17 - 2015 සැප්තැම්බර් මස 22 වැනි අඟහරුවාදා - 2015.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

**2015 අංක 352/11**

ජනා.කා.අංකය : සීඑස්ජී/1/24/1

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව පත්කරන ලදුව 2015 සැප්තැම්බර් මස 14 දිනැති *අංක 1932/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද පහත සඳහන් අමාත්‍යවරුන්ගේ අමාත්‍ය ධූරයන් අතිගරු ජනාධිපතිතුමා විසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති පරිදි වෙනස් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | |
|---|---|
| 1. තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍ය<br>ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා, පා.ම. | ''තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය''<br>වශයෙන් |
| 2. තාක්ෂණ, තාක්ෂණ අධ්‍යාපන හා රැකියා අමාත්‍ය<br>ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා, පා.ම. | ''විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය''<br>වශයෙන් |
| 3. ඛනිජ තෙල් හා පෙට්‍රෝලියම් වායු පිළිබඳ අමාත්‍ය<br>ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා, පා.ම. | ''ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය''<br>වශයෙන් |

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

2015 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 21298 — 565 (2015/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2015 අංක 352/12**

ජනා.කා.අංකය : සීඑස්ඒ/1/24/1

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව පත්කරන ලදුව 2015 සැප්තැම්බර් මස 18 දිනැති *අංක 1932/69 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද පහත සඳහන් නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ නියෝජ්‍ය අමාත්‍ය ධූරයන් අතිගරු ජනාධිපතිතුමා විසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති පරිදි වෙනස් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | |
|---|---|
| 1. තිරසාර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍ය ගරු සුමේධා ජී. ජයසේන මැතිතුමිය, පා.ම. | ''තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍ය'' වශයෙන් |
| 2. ඛනිජ තෙල් හා පෙට්‍රෝලියම් වායු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු අනෝමා ගමගේ මැතිතුමිය, පා.ම. | ''ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය'' වශයෙන් |

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

2015 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.